සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2024
## Third Term Test - Grade 12 - 2024

විභාග අංකය: ....................................

## ව්‍යාපාර අධ්‍යයනය - I

කාලය පැය 02 යි

උපදෙස්:-

- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම සපයන්න.
- ප්‍රශ්න අංක 1 සිට 30 තෙක් වූ ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු තෝරා, එහි අංකය ප්‍රශ්නය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
- ප්‍රශ්න අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්න වලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරි මත ලියන්න.
- සෑම ප්‍රශ්නයකට ම ලකුණු දෙක බැගින් හිමි වේ.

| ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|
| 01 - 30 | |
| 31 - 50 | |
| එකතුව | |

(01) පහත සඳහන් ඒවායින් ව්‍යාපාර අරමුණක් නොවන්නේ,

(1) වෙළඳපොලේ රැඳී සිටීම. (2) ලාභ උපරිම කිරීම.

(3) සම්පත්වලට අගය එකතු කිරීම. (4) විකුණුම් උපරිම කිරීම.

(5) කොටස් වල වෙළඳපළ අගය උපරිම කිරීම. (..........)

(02) සෞඛ්‍ය සේවා දෙපාර්තුමේන්තුව සම්බන්ධයෙන් පහත සඳහන් ඒවායින් නිවැරදි නොවන්නේ,

(1) තෘතිය අංශයේ ව්‍යාපරයකි. (2) සේවා අංශයේ ව්‍යාපාරයකි.

(3) පොදු අංශයේ ව්‍යාපාරයකි. (4) කාර්මික අංශයේ ව්‍යාපාරයකි.

(5) ලාභ අරමුණු කර නොගත් ව්‍යාපරයකි. (..........)

(03) ව්‍යාපාරයටම අවේනික වූ දියුණු චර්යාධර්ම, පුරුදු, ධනාත්මක ඇගයීම් හා මනා හර පද්ධතියක් අයත් වන්නේ,

(1) සමාජ හා සංස්කෘතික පරිසරයටය. (2) සංවිධාන ව්‍යුහය යටතටය.

(3) ප්‍රජා පරිසරය යටතට ය. (4) නෛතික පරිසරය යටතටය.

(5) සංවිධානමය සංස්කෘතිය යටතටය. (..........)

(04) ආර්ථික පරිවර්තන පනත හා උද්ධමනය පිළිවෙලින් අයත්වනුයේ,

(1) ආර්ථික පරිසරය හා ආර්ථික පරිසරය (2) ආර්ථික පරිසරය හා නෛතික පරිසරය

(3) නෛතික පරිසරය හා ආර්ථික පරිසරය (4) දේශපාලන පරිසරය හා ආර්ථික පරිසරය

(5) ආර්ථික පරිසරය හා දේශපාලන පරිසරය (..........)

(05) ව්‍යාපාරයන් මානව විවිධත්වයට ගරුකරමින් කටයුතු කළ යුත්තේ,

(1) ලාභ උපරිම කිරීමට ය.

(2) සමාජ හා සංස්කෘතික තිරසර බව තහවුරු කිරීමට ය.

(3) වෙළඳපල කොටස උපරිම කිරීමට ය.

(4) ආර්ථික තිරසර බවට දායක වීමට ය.

(5) පාරිසරික තිරසර බවට දායක වීමට ය. (..........)

(06) 2023 වසරේ රජයේ බදු නොවන ආදායම මුළු රාජ්‍ය ආදායමේ ප්‍රතිශතයක් ලෙස,

(1) 10.8 % (2) 29.9 % (3) 89.2 % (4) 30.1 % (5) 70.1 % (..........)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(07) රජයේ මූල්‍ය ප්‍රතිපත්ති උපකරණයක් නොවන්නේ,

(1) ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (2) විවෘත වෙළඳපොල කටයුතු

(3) පොලී අනුපාතිකය (4) ණයසීමා පැනවීම

(5) සේවා නියුක්ති අනුපාතය (..........)

(08) 1985 වසරේ දී ලෝකය ඇති කර ගැනීමට ආරම්භ කල වියේනා (Vienna convention) සම්මුතියේ මූලික අරමුණ වූයේ,

(1) දේශගුණික වෙනස්වීම් පාලනය (2) ඕසෝන් ස්ථරය සුරැකීම

(3) අපද්‍රව්‍ය කළමණාකරණය (4) සාගරයන් සුරැකීම

(5) න්‍යෂ්ඨික අවි භාවිතය නැවැත්වීම (..........)

(09) හවුල් ව්‍යාපාරයක් ලියා පදිංචි කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ බලපාන නීතිය වන්නේ,

(1) 1890 හවුල් ආඥාපනත

(2) 1907 සීමිත හවුල් ආඥා පනත

(3) 1918 අංක 06 දරණ ව්‍යාපාර නාම ආඥා පනත

(4) 2007 අංක 07 දරණ සමාගම් පනත

(5) 1840 වංචා වැළැක්වීමේ ආඥා පනත (..........)

(10) පහත සඳහන් ප්‍රකාශ අතරින් සීමා සහිත පෞද්ගලික සමාගමක් සම්බන්ධයෙන් වූ නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) අවම සාමාජික සංඛ්‍යාව 01 ක් වීම හා උපරිමය සීමාවක් නැත.

(2) අවම අධ්‍යක්ෂකවරු සංඛ්‍යාව 02 ක් වීම හා උපරිමය සීමාවක් නැත.

(3) කොළඹ කොටස් හුවමාරුවේ ලයිස්තුගත විය හැකිය.

(4) කොටස් හෝ ණයකර ප්‍රසිද්ධියේ නිකුත් කළ හැකිය.

(5) ණය ගෙවීමේ හැකියා පරීක්ෂණයකින් තොරව ලාභාංශ බෙදා හැරිය හැකිය. (..........)

(11) a) ස්වෙච්ඡා හා විවෘත්ත සමාජිකත්වය

b) සමාජය ගැන සැලකිලිමත් වීම

c) පොදු අවශ්‍යතා හා අපේක්ෂණ වලින් යුක්ත වීම

d) අත්‍යාවශ්‍ය භාණ්ඩ සාදාරණ මිලට සැපයීම

e) ප්‍රජාතන්ත්‍රවාදී සාමාජික පාලනය

ඉහත කරුණු අතරින් සමුපකාර ප්‍රතිපත්ති පමණක් වෙන් කර ගත් විට නිවැරදි පිළිතුර වන්නේ,

(1) a, b හා c (2) a, b හා d (3) a, c හා d

(4) a, b හා e (5) c,d හා e (..........)

(12) ඇපයෙන් සීමිත සමාගමක සිටිය හැකි අවම හා උපරිම සංඛ්‍යාව නිවැරදි ව දක්වා ඇත්තේ,

(1) අවමය 01 උපරිමය 50 (2) අවමය 02 උපරිම 50

(3) අවමය 01 උපරිමයේ සීමාවක් නැත (4) අවමය 02 උපරිමයේ සීමාවක් නැත

(5) අවමය 02 උපරිමය 20 (..........)

(13) පහත සඳහන් කරුණු අතරින් ව්‍යවසායකත්වයේ පුද්ගල ප්‍රතිලාභයක් වන්නේ,

(1) නව රැකියා අවස්ථා උදාවීම. (2) සමාජ තත්වය හා පිළිගැනීම ඇතිවීම

(2) පූර්ණ සේවා නියුක්තිය ඇතිවීම (4) නව භාණ්ඩ පරිභෝජනයට අවස්ථාව උදා වීම

(5) ජනතාවගේ ජීවන මට්ටම ඉහළ යාම (..........)

(14) පහත සඳහන් දෑ අතරින් ව්‍යවසායකත්ව කුසලතාවයක් ලෙස සැලකෙන්නේ,

(1) නියාමනය (2) ඵලදායකත්වය (3) නායකත්වය

(4) අභිප්‍රේරණය (5) කැපවීම (..........)

(15) අන්තර්ජාතික සහයෝගිතාවය සඳහා වූ ජපාන බැංකුව මූල්‍ය අනුග්‍රහය දක්වන ජාතික සංවර්ධන බැංකුව ප්‍රතිමූල්‍ය පහසුකම් සපයන කුඩා ව්‍යාපාර සඳහා ආධාර සපයන යෝජනා ක්‍රමය වන්නේ,

(1) සහන්‍යා (2) සුවන ණය ව්‍යාපෘතිය (3) නිපුණතා සංවර්ධන ව්‍යාපෘති

(4) ගැමි පුබුදුව (5) සමෘද්ධි සංවර්ධන බැංකුව (..........)

(16) පහත X තීරුවේ මුදල් වර්ග ද Y තීරුවේ එම මුදල් වර්ග වලට අදාළ නිදසුන් ද දැක්වේ.

| X | Y |
|---|---|
| 1. ව්‍යවහාර මුදල්<br>2. බැංකු මුදල්<br>3. විද්‍යුත් මුදල්<br>4. ආසන්න මුදල් | A ජංගම ගිණුම් වල ශේෂය<br>B කාසි හා නෝට්ටු<br>C ස්ථාවර තැන්පතු<br>D ණයපත් |

ඉහත සඳහන් මුදල් වර්ගවලට ගැළපෙන නිදසුන් ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුරු කාණ්ඩය තෝරන්න.

(1) 1 - B, 2 - C, 3 - D, 4 - A (2) 1 - B, 2 - A, 3 - D, 4 - C

(3) 1 - D, 2 - C, 3 -B, 4 - A (4) 1 - C, 2 - A, 3 - B, 4 - D

(5) 1 - B, 2 - D, 3 - C, 4 - A (..........)

(17) ඒකක භාරයකට අයත් පාර්ශවයන් නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) ඒකක භාරකරු, ඒකක අරමුදල, ඒකක හිමියන්

(2) ඒකක හිමියන්, ආයෝජකයින්, ප්‍රාරක්ෂකයින්

(3) ඒකක භාරකරු, තැරැව්කරුවන්, ඒකක හිමියන්

(4) අරමුදල් කළමනාකරණ සමාගම්, ඒකක හිමියන්, ඒකක භාරකරු

(5) ඒකක කළමණාකරණ සමාගම්, ප්‍රාරක්ෂකයින්, තැරැව්කරුවන් (..........)

(18) පහත දැක්වෙන්නේ ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය තුළ ක්‍රියාත්මක වන මූල්‍ය ආයතන කිහිපයකි.

A - රක්ෂණ සමාගම්

B - ඒකකභාර

C - ව්‍යවසායකත්ව ප්‍රාග්ධන සමාගම්

D - සේවක අර්ථසාධක අරමුදල

E - සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල

F - විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම.

ඉහත සඳහන් මූල්‍ය ආයතන අතරෙන් ගිවිසුම් ගත ඉතිරි කිරීමේ ආයතන පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) A, D, E (2) B, C, F (3) B, D, F

(4) D, E, F (5) A, C, E (..........)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(19) කසුන් රාජ්‍ය ආයතනයක් සේවකයෙකි. ඔහුගේ වයස අවුරුදු 35 කි. ඔහුට රැකියාවෙන් ලැබෙන වැටුපට අමතරව වෙනත් ආදායම් මාර්ග ද පවතී. ඔහු රක්ෂණ සමාගමකින් ජීවිත රක්ෂණයක් ලබා ගැනීමට අපේක්ෂා කරයි. එහිදී කසුන් විසින් උපරිම විශ්වාසය තහවුරු කිරීමට ඉදිරිපත් කිරීමට අවශ්‍ය නොවන තොරතුරු වන්නේ,

(1) කසුන්ගේ වයස (2) සෞඛ්‍ය තත්වය

(3) කසුන්ගේ පුරුදු හා විනෝදාංශ (4) යැපෙන්නේ පිළිබඳ තොරතුරු

(5) වන්දි ගෙවන අවස්ථා (..........)

(20) ගිනි රක්ෂණය යටතේ ගිනි හානි වලට අමතරව අතිරේඛ ආවරණය කරගත හැකි වෙනත් අවදානම් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) පිපිරීම් හානි, මාර්ගස්ථ මුදල් හානි, භූමිකම්පා හානි, ගැටීම් හානි

(2) විදුලිමය ආපදා හානි, සොරබිය හානි, භූමිකම්පා හානි, පිපිරීම් හානි

(3) වැඩ වර්ජන හානි, සොරබිය හානි, භූමිකම්පා හානි, පිපිරීම් හානි

(4) මාර්ගස්ථ මුදල් හානි, පිපිරීම් හානි, අනුශාංගික අලාභ හානි, සොරබිය හානි

(5) අනුශාංගික අලාභ හානි, කැරලි කෝලහාල හානි, විදුලි ආපදා හානි, ගැටීම් හානි (..........)

(21) අලෙවි විධායකයෙකු ලෙස සේවය කරන නදිෂා පසුගිය වසර 5 ක අලෙවිකරණ තොරතුරු සවිස්තරාත්මකව ඉදිපරිත් කිරීමට සූදානමින් සිටී. ඒ සඳහා වඩාත් සුදුසුම සන්නිවේදන ක්‍රමය කුමක් ද?

(1) මුහුණට මුහුණලා පවත්වන රැස්වීම් (2) දුරකථනය

(3) වාර්ථාව (Report) (4) මෙමෝපත්‍රය (Memo)

(5) විද්‍යුත් තැපැල (..........)

(22) කථිකයෙකු තම සිතට නැගුණු අදහස් වචන බවට පරිවර්ථනය කරයි. මෙම ක්‍රියාව අයත් සන්නිවේදන මූලිකාංගය වන්නේ,

(1) ප්‍රතිපෝෂණය (2) ප්‍රතිචාරය (3) ආකේතනය

(4) විකේතනය (5) පණිවිඩය (..........)

(23) පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) මාධ්‍ය, සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංගයකි.

(2) හුවමාරුවක් සිදු වීමට සන්නිදෙව්නය අත්‍යවශ්‍යය.

(3) සන්නිවේදනය ආරම්භ කරන්නේ යවන්නා ය.

(4) පණිවිඩය ලබන්නා විසින් ඇසුණු හෝ කියවූ පණිවිඩය පිළිබඳව ක්‍රියා කරන ආකාරය ප්‍රතිපෝෂණයයි.

(5) ඉහත සියළු ප්‍රකාශ සාවද්‍ය වේ. (..........)

(24) ප්‍රවාහනයේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන සමාජ පිරිවැයක් ලෙස සැලකිය හැක්කේ,

(1) ප්‍රවාහන මාධ්‍ය අත්පත් කර ගැනීමට දරන පිරිවැය

(2) වාහන අනතුරු නිසා ජීවිත අහිමි වීම

(3) ඉන්ධන සඳහා වැය වන පිරිවැය

(4) වාහන අනතුරු වලින් මෝටර් රථයට වන හානි

(5) අමතර කොටස් සඳහා වැය වන පිරිවැය. (..........)

(25) පහත X තීරුවේ ප්‍රවාහන මාධ්‍යයන් ද Y තීරුවේ මාර්ගයන් ද දැක්වේ. X හා Y නිවැරදිව ගලපා ඇති පිළිතුර තෝරන්න.

| X | Y |
|---|---|
| 01. ඩක්කුව | A - මහාමාර්ග |
| 02. බයිසිකල් | B - දුම්රිය මාර්ග |
| 03. ගුවන්යානා | C - ගුවන් මාර්ග |
| 04. බෝට්ටු | D - ජල මාර්ග |

(1) 01 - A, 02 - B, 03 - C, 04 - D (2) 01 - B, 02 - C, 03 - D, 04 - A
(3) 01 - C, 02 - B, 03 - D, 04 - A (4) 01 - B, 02 - A, 03 - C, 04 - D
(5) 01 - D, 02 - B, 03 - C, 04 - A (..........)

(26) පෞද්ගලික මගී ප්‍රවාහන බස්රථයක් මහා මාර්ගයේ ධාවනය කිරීමට අතවශ්‍යය ලියවිලි කිහිපයක් පමණක් සඳහන් වන්නේ,
(1) දුම් පරීක්ෂණ වාර්ථාව / අවම තෙවන පාර්ශවීය රක්ෂණය / යෝග්‍යතා සහතිකය / මාර්ග බලපත්‍ර
(2) දුම් පරීක්ෂණ වාර්ථාව / අවම තෙවන පාර්ශවීය රක්ෂණය / මාර්ග බලපත්‍රය / යෝග්‍යතා සහතිකය
(3) වලංගු රියදුරු බලපත්‍රය හා ආදායම් බලපත්‍රය / දුම් පරීක්ෂණ වාර්ථාව / විස්තීර්ණ රක්ෂණය / යෝග්‍යතා සහතිකය.
(4) ආදායම් බලපත්‍රය / තෙවන පාර්ශවීය රක්ෂණය / රියසහයක බලපත්‍රය / මාර්ග බලපත්‍රය
(5) ලියාපදිංචි සහතිකය / රියදුරු බලපත්‍රය / විස්තීර්ණ රක්ෂණය / ආදායම් බලපත්‍රය (..........)

(27) සරත් පෙරේරා විකිණීමට ඉඩම් සහ මෝටර් රථ පිලබඳව තොරතුරු සොයා ගෙන ඒවා ගැනුම් කරුවාට ඉදිරිපත් කර ගනුදෙනුවක් සිදු වීමට අවශ්‍ය පරිසරය නිර්මාණය කරදෙයි. ඉන් පසුව තමා සමග සම්බන්ධ වූ පාර්ශවයෙන් 3% ක ගාස්තුවක් අයකරනු ලබයි.
සරත් පෙරේරාව හැඳින්විය හැක්කේ,
(1) වෙළෙන්දෙකු ලෙස (2) වෙන්දේසිකරුවෙකු ලෙස
(3) සාධ්‍යකයෙකු ලෙස (4) කැපකරු නියෝජිතයෙකු ලෙස
(5) බ්‍රෝකර්වරයෙකු ලෙසය (..........)

(28) සරත් පෙරේරාට හිමිවන ගෙවීම වන්නේ,
(1) කොමිස් මුදලකි (2) වෙන්දේසි ගාස්තුවකි (3) වැටුපකි
(4) තරව්කාර ගාස්තුවකි (5) කැපකරු කොමිස් (..........)

(29) සිල්ලර වෙළඳාමේ ප්‍රධාන ලක්ෂණය වන්නේ,
(1) අවසාන පරිභෝජනය සඳහා භාණ්ඩ හෝ සේවා අලෙවි කිරීමය
(2) ණයට භාණ්ඩ අලෙවි කිරීමය
(3) පාරිභෝගිකයා සමග සමීප සම්බන්ධතාවයන් පවත්වා ගැනීම
(4) නැවත විකිණීම සඳහා භාණ්ඩ අලෙවිය
(5) භාණ්ඩ වර්ග එකක් පමණක් අලෙවි කිරීමය (..........)

(30) නිදහස් ජාත්‍යන්තර වෙළඳාමට බලපාන තීරුබදු නොවන බාධාවක් වනුයේ,
(1) භාණ්ඩ ප්‍රවර්ධණය (2) වෙළඳ ගිවිසුම්
(3) රේගුව විසින් අයකරන බදු (4) ස්වාභාවික සම්පත් බෙදීයාමේ විෂමතාව
(5) සාපේක්ෂව පිරිවැය වාසිය (..........)

- **අංක 31 සිට 40 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේ දී සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**

(31) (අ) විකුණුම් හෝ හුවමාරුව සිදුවීම ව්‍යාපාරයක.............................................. වන අතර විකුණුම් උපරිම කිරීම ව්‍යාපාරයක ............................................... කි.

(ආ) මුදලේ විකාශනය ................................................ මුදල් භාවිතයත් සමග ඇරඹුණු අතර ඊළඟ යුගය වනුයේ .................................................. මුදල් භාවිතයයි.

(32) (අ) කර්මාන්ත මූලය අනුව ව්‍යාපාර වර්ගී කිරීමේ දී විදුලිය, ගෑස් වාෂ්ප හා වායු සමීකරණය සැපයීම................................අංශයට ද නිවාස අයිතිය හා දේපළ වෙළඳාම ....................................... අංශයට ද අයත් වේ.

(ආ) ජනවාර්ගික මිශ්‍රය ................................................ පරිසරයේ සාධකයක් වන අතර පුද්ගලයින් තුළ පවත්නා විශ්වාස වටිනාකම් ආදිය ............................................... පරිසරයේ සාධකයකි.

(33) (අ) මිහිකත සමුළුව ලෙස කෙටියෙන් හැඳින්නේනේ ........................................... පිළිබඳ සමුළුව වන අතර එහිදී දේශගුණික වෙනස්වීම් පිළිබඳව ඇතිකරගත් සම්මුතියක් ලෙස...................................... සම්මුතිය හැඳින්විය හැක.

(අ) අඩු වටිනාකමක් ඇති අමුද්‍රව්‍ය ඉහළ වටිනාකමක් ඇති නිෂ්පාදිත බවට පත් කිරීම..................................... ලෙස හැඳින්වෙන අතර ඉහළ වටිනාකමක් ඇති නිෂ්පාදිත අඩු වටිනාකම්ක් ඇති අමුද්‍රව්‍ය බවට පත් කිරීම......................................... ලෙස හැඳින්වේ.

(34) (අ) රජයේ පුනරාවර්ථන වියදමින් වැඩි ප්‍රතිශතයක් ......................................... සඳහා වැයවන අතර ඊළඟ වැඩිම ප්‍රතිශතය ........................................... සඳහා වැය වේ.

(ආ) 2023 වර්ෂයේ රජයේ බදු ආදායමින් වැඩි ප්‍රතිශතයක් ......................................... වලින් උපයාගත් අතර ඊළඟ වැඩිම ප්‍රතිශතය ......................................... බදු වලින් උපයා ගන්නා ලදී.

(35) අ) අඛණ්ඩ පැවැත්මක් හෙවත් .......................................... පැවතීම සංස්ථාපික සමාගමක සුවිශේෂී ලක්ෂණයක් වන අතර මෙවැනි සමාගමක් එහි සාමාජිකයන්ගෙන් වෙන් වූ ....................................... ලෙස සැලකේ.

(ආ) ශ්‍රී ලංකාවේ සමුපකාර සමිතියක්.................................... සමුපකාර සමිති පනත යටතේ ලියා පිදිංචි කළ යුතු වන අතර ඒ සඳහා අවම වශයෙන් පුද්ගලයින් ...................................... කු එක්විය යුතුය.

(36) (අ) ................................ හා ............................... අතර අතරමැදියෙකු ලෙස කටයුතු කිරීම ව්‍යවසායකත්වය ලෙස හඳුන්වා දිය හැකි අතර ............................................... හැකියාව දරන්නා ව්‍යවසායකයෙකි.

(ආ) ව්‍යවසායෙකුට තම අනුගාමිකයන් ලවා කටයුතු කිරීමට ඇති හැකියාව ...................................... ලෙස ද බාහිර හා අභ්‍යන්තර පාර්ශව සමග මනා සම්බන්ධතා පවත්වාගෙන යාමට ඇති හැකියාව .......................................... ලෙසද හැඳින්වේ.

(37) (අ) ව්‍යාපාරයේ කළමනාකරණය ..................................... වීම හා බොහෝ විට ................................ ප්‍රධාන කළමනාකරු වීම කුඩා ව්‍යාපාරයක ලක්ෂණයකි.

(ආ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වලට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙන් ...................................... සේවා ලබාගත හැකි අතර ජාතික සංවර්ධන බැංකුවෙන් ........................................ පහසුකම් ලබාගත හැකිය.

(38) (අ) ....................................... හා විකුණුම්කරුවෙකු අතර කිසියම්................................... නිෂ්පාදිත වල අයිතිය හුවමාරු වීමේ ක්‍රියාවලිය වෙළඳාම නම් වේ.

(ආ) විදේශ වෙළඳාමේ දීභාවිතා කරන ගබඩා .......................................... ලෙස හඳුන්වන අතර ඇනවුම් ............................................. ලෙස හඳුන්වායි.

(39) (අ) රක්ෂණයේ දී අවදානමක් ලෙස සලකන්නේ.............................වශයෙන්........................ ........................... කළ හැකි අවදානමක් සිදුවීමට ඇති ඉඩකඩයි.

(ආ) රක්ෂණය සම්බන්ධයෙන් උපරිම විශ්වාසය යනු රක්ෂණය කරනු ලබන ................................... සම්බන්ධයෙන් රක්ෂකයා හා රක්ෂිතයා විසින් හෙළිදරව් කළ යුතු රක්ෂණ ගිවිසුමට අදාළ සියලු තොරතුරු.................................... යුතුව හෙළිදරව් කිරීමයි.

(40) (අ) ................................. නොභාරපතක් වෙනුවට ............................... නොභාරපතක් ලබා ගැනීමට ............................. ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

(ආ) රටවල් කිහිපයක් විසින් බදු, තීරු ගාස්තු පිළබඳ ගිවිසුමකට එළඹි නිදහස් වෙළඳ ප්‍රදේශයන්................................... නම් වේ.

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources
iexamhub

* **අංක 41 සිට 50 තෙක් ප්‍රශ්න වලට සුදුසු පිළිතුරු ලියන්න.**

(41) ව්‍යාපාරයක ගති ලක්ෂණ 04 ක් සඳහන් කරන්න.

.........................................................................................................................

.........................................................................................................................

.........................................................................................................................

.........................................................................................................................

(42) ආර්කථියක පැවැත්මට ව්‍යාපාර දායකවන ආකාර 04 ක් සඳහන් කරන්න.

.........................................................................................................................

.........................................................................................................................

.........................................................................................................................

.........................................................................................................................

(43) ව්‍යාපාරයකින් සේවකයින් ට ඉටුවිය යුතු සමාජ වගකීම් 04 ක් සඳහන් කරන්න.

.........................................................................................................................

.........................................................................................................................

.........................................................................................................................

.........................................................................................................................

(44) පාරිභෝගික ජාත්‍යන්තරය විසින් දක්වා ඇති පාරිභෝගික අයිතිවාසිකම් 04 ක් සඳහන් කරන්න.

.........................................................................................................................

.........................................................................................................................

.........................................................................................................................

.........................................................................................................................

(45) රාජ්‍ය ස්ංස්ථාවක ලක්ෂණ 04 ක් ලියන්න.

.........................................................................................................................

.........................................................................................................................

.........................................................................................................................

.........................................................................................................................

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(46) පළාත් පාලන ආයතන යටතේ පවතින ව්‍යාපාර වල ලක්ෂණ 04 ක් ලියන්න.

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

(47) ව්‍යවසායකත්ව ගති ලක්ෂණ හා කුසලතා වර්ධනය කර ගත හැකි ආකාර 04 ක් ලියන්න.

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

(48) බලපත්‍රලාභී විශේෂ බැංකු, ව්‍යාපාර වල ක්‍රියාකාරිත්වයට දායක වන ආකාර 04 ක් ලියන්න.

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

(49) ගෙවීම් සඳහා බැංකුවට ඉදිරිපත් කරනු ලබන චෙක්පත් වලට මුදල් ගෙවීම බැංකුව විසින් ප්‍රතික්ෂේප කරන අවස්ථා 04 ක් සඳහන් කරන්න.

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

(50) විද්‍යුත් වෙළඳාමේ ක්‍රියාපටිපාටිය පියවර 04 කින් සමන්විත වේ. එම ක්‍රියා පටිපාටිය ලියා දක්වන්න.

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

**තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2024**
**Third Term Test - Grade 12 - 2024**

විභාග අංකය: ......................................

# ව්‍යාපාර අධ්‍යයනය - II

කාලය පැය 03 යි
(අමතර කියවීම් කාලය විනාඩි 10 යි)

උපදෙස්:-
- එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙක බැගින් වත් තෝරාගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

## I - කොටස

(01) රසික තම ගෙවත්තේ එළවළු වගා කරන අතර ඒවා තම නිවසේ පරිභෝජනයට වෙන්ව කල්තබා ගත හැකි පරිදි වියලා සෞඛ්‍ය ආරක්ෂිතව ඇසුරුම්කොට විදේශ රටවලට ද අපනයනය කරයි.

i. (අ) ශ්‍රී ලංකාවේ වර්තමාන ආර්ථික අර්බුදයට රසිකගේ ව්‍යාපාරය වැනි ව්‍යාපාර පිළියමක් වන්නේ කෙසේ ද? (ල. 02)

(ආ) මෙම සිද්ධිය තුළින් ඍජු නිෂ්පාදනයට හා වක්‍ර නිෂ්පාදනයට උදාහරණ සපයන්න. (ල. 02)

ii. (අ) රසිකගේ ව්‍යාපාරය ප්‍රවර්ධනය උදෙසා අන්තර්ජාලය භාවිතා කල හැකි ආකාර දෙකක් සඳහන් කරන්න. (ල. 02)

(ආ) රසික තම නිෂ්පාදිත සඳහා ආහාර සුරක්ෂිතතාව පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිති ආයතනයේ ප්‍රමිතියක් ලබා ගැනීමට අපේක්ෂා කරයි නම් ඒ සඳහා සුදුසුම ප්‍රමිතිය හා පරිසර සුරක්ෂිතතාව පිළිබඳ සුදුසුම ප්‍රමිතිය සඳහන් කරන්න. (ල. 02)

iii. විද්‍යුත් වාණිජයට වඩා විද්‍යුත් ව්‍යාපාර පුළුල් සංකල්පයකි. පැහැදිලි කරන්න. (ල. 04)

iv. ජනිදු මහා පරිමාණ වශයෙන් සූර්ය පැනල සවිකර එයින් නිපදවන විදුලිය තම නිවසේ සහ ව්‍යාපාරය සඳහා භාවිතා කරන අතර මෙය ව්‍යාපාරික කටයුත්තක් ලෙස ද යොදා ගනිමින් ජාතික විදුලිබල පද්ධතියට විදුලිය අලෙවිකර ලාභ ලබයි.

v. (අ) ජනිදුගේ මෙම ව්‍යාපාර කටයුත්ත කර්මාන්ත මූලය අනුව හා හිමිකාරිත්වය අනුව වර්ග කර දක්වන්න. (ල. 02)

(ආ) ගෝලීය පාරිසරික තත්වයන් සඳහා උදාහරණ 04 ක් සඳහන් කරන්න. (ල. 02)

v. වර්තමාන ප්‍රවණතාවයන් ලෙස ශ්‍රී ලංකාවේ ජනගහණයේ වයස්ගත ජනගහනය ඉහළ යමින් පවතී. මෙය කුමන පරිසරයකට අයත් දැයි දක්වා මෙම ප්‍රවණතාව ව්‍යාපාර අවස්ථාවක් කර ගත හැකි දැයි උදාහරණ 03 ක් මගින් දක්වන්න. (ල. 04)

(02) i. (අ) ව්‍යාපාර සමාජ වගකීම් පිළිබඳව වන ඇමරිකා එක්සත් ජනපදයේ නිර්වචනය දක්වන්න. (ල. 02)

(ආ) ව්‍යාපාරයකින් සමාජයට ඉටුවිය යුතු සමාජ වගකීම් 04 ක් සඳහන් කරන්න. (ල. 02)

ii. (අ) සමාජීය වගකීම් ඉටු කිරීමෙන් ව්‍යාපාරයකට අත්වන ප්‍රතිලාභ 04 ක් සඳහන් කරන්න. (ල. 02)

(ආ) තිරසාර සංවර්ධනය යනු කුමක්දැයි නිර්වචනය කොට එහි ප්‍රධාන කොටස් 03 සඳහන් කරන්න. (ල. 02)

iii. පරිසර තිරසර ආරක්ෂණය අතීතයට වඩා වර්තමානයට ඉතා වැදගත් වේ. පැහැදිලි කරන්න. (ල. 04)

iv. අපද්‍රව්‍ය කළමනාකරණයේ දී යොදා ගත හැකි 4R සංකල්පය සඳහන් කර එකිනෙක පැහැදිලි කරන්න. (ල. 04)

v. (අ) ව්‍යාපාර ආචාරධර්ම සංකල්පය පැහැදිලි කරන්න. (ල. 02)

(ආ) ව්‍යාපාර ආචාරධර්ම පද්ධතියක් ගොඩනැගීමේදී සලකා බැලිය යුතු කරුණු 04ක් සඳහන් කරන්න. (ල. 02)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(03) යම්කිසි රටක රජයක් විසින් එම රටෙහි ඇති වූ ආර්ථික තත්වය හමුවේ පොලී අනුපාතික ඉහළ දැමීමට තීරණය කරන ලදී.

i. ඉහත ආර්ථිකයේ රජය විසින් ගත් ක්‍රියාමාර්ගය එම ආර්ථිකයේ ව්‍යාපාර වලට බලපෑම් කරන අයුරු පැහැදිලි කරන්න. (ල. 04)

ii. (අ) ඍජු බදු සඳහා උදාහරණ දෙකක් දක්වන්න. (ල. 02)

(ආ) රජයේ ණය සීමා පැනවීම් තුළ ප්‍රමාණාත්මක ණය සීමා පැනවීම් යනු කුමක්දැයි පැහැදිලි කරන්න. (ල. 02)

iii. (අ) පාරිභෝගික වගකීම් 04 ක් සඳහන් කරන්න.

(ආ) හිටපු ඇමරිකානු ජනාධිපතිවරයෙකු වූ ජෝන් F. කෙනඩි විසින් ඉදිරිපත් කරන ලද පාරිභෝගික අයිතිවාසිකම් 04 ක් සඳහන් කරන්න. (ල. 02)

iv. (අ) විධිමත් සංවිධානයක දැකිය හැකි පොදු ලක්ෂණ 03 ක් නම් කරන්න. (ල. 02)

(ආ) පහත සඳහන් ව්‍යාපාර ආයතන අයත් ව්‍යාපාර සංවිධාන වර්ගය නම් කරන්න.

A - සෙලින්කෝ පී. එල්. සී.

B - සීමා සහිත මැලිබන් බිස්කට් සමාගම

D - ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය (ල. 02)

v. (අ) ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාර සංවිධාන වර්ග 04 ක් නම් කරන්න. (ල. 02)

(ආ) සීමිත හවුල් ව්‍යාපාරයක් හා අසීමිත හවුල් ව්‍යාපාරයක් අතර වෙනස්කම් 02 ක් ලියන්න. (ල. 02)

(04) සඳුන් රත්නායක ඔහුගේ මිතුරෙකු වූ නඳුන් පෙරේරා හා එක්ව ව්‍යාපාර ආයතනයක් ආරම්භ කිරීමේ අදහසින් පසු වෙයි.

i. (අ) හවුල් ව්‍යාපාරයක් නැතහොත් සීමා සහිත පුද්ගලික සමාගමක් කෙරෙහි ඔවුන් තම අවධානය යොමු කළේ නම් එම ව්‍යාපාර සංවිධාන දෙක අතර ඇති සමානකම් 02 ක් ලියන්න. (ල. 02)

(ආ) සීමා සහිත පුද්ගලික සමාගමක් ආරම්භ කිරීමටත් ඒ සඳහා ඔවුන්ගේ නම් වල මුල් නම පමණක් යොදා ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමටත් අදහස් කළේ නම් ව්‍යාපාර ආයතනයේ නාමය ලියා දක්වන්න. (ල. 01)

(ඇ) සී/ස පුද්ගලික සමාගමක වාසි දෙකක් ලියන්න. (ල. 01)

ii. (අ) සීමා සහිත පොදු සමාගමක් ආරම්භ කිරීමට අදහස් කළේ නම් ඉහත දැක්වූ නාමය වෙනස් විය යුතු ආකාරය දක්වා සීමා සහිත පොදු සමාගම් වල ඔබ දකින අවාසි 02 ක් නම් කරන්න. (ල. 02)

(ආ) සීමා සහිත පුද්ගලික සමාගමක් හා පොදු සමාගමක් අතර අසමානකම් 04 ක් ලියන්න. (ල. 02)

iii. (අ) සීමා සහිත සමාගමක් ලියාපදිංචි කිරීම සඳහා පිළියෙල කළ යුතු ලේඛණ නම් කරන්න. (ල. 02)

(ආ) ව්‍යවසායකත්වයේ ආයතනික ප්‍රතිලාභ 04 ක් ලියන්න. (ල. 02)

iv. (අ) ව්‍යවසායකත්වය තුළින් නව රැකියා සම්පාදනයක් සිදු වන අතර නව රැකියා සම්පාදනයෙන් ආර්ථික සංවර්ධනය වේගවත් වේ. ඊට අදාළ වන මෙම රූප සටහන් හිස්තැන් සඳහා යෙදිය යුතු පිළිතුරු ලියා දක්වන්න. (ල. 02)

නව රැකියා අවස්ථා

↓

1. ..........

↓

2. ..........

↓

භාණ්ඩ ඉල්ලුම ඉහළ යාම

↓

3. ..........

↓

4. ..........

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(ආ) ව්‍යවසායකයෙකු සතු විය යුතු කුසලතා 04 ක් ලියන්න. (ල. 02)

v. ව්‍යවසායකයෙකු හා ව්‍යාපාරිකයෙකු අතර දකින වෙනස් කම් 04 ක් ලියන්න. (ල. 04)

## II කොටස

(05) i. (අ) ශ්‍රී ලංකාව වැනි රටක සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හඳුනා ගැනීම අවශ්‍ය වන්නේ කවර හේතූන් නිසා දැයි දැක්වීමට කරුණු 02 ක් ලියන්න. (ල. 02)

(ආ) ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හඳුනා ගැනීම සඳහා යොදා ගනු ලබන ප්‍රමාණාත්මක නිර්ණායක 04 ක් ලියන්න. (ල. 02)

ii. (අ) සුළු ව්‍යාපාරයක් යන්න හඳුන්වන්න.

(ආ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වලට දිරි ගැන්වීම් සපයන රාජ්‍ය ආයතන 04 ක් නම් කරන්න. (ල. 02)

iii. (අ) විද්‍යුත් මුදල් මගින් ගණුදෙනු කිරීම පහසු කිරීම සඳහා සොයා ගත යුතු පහසුකම් 04 ක් ලියන්න. (ල. 02)

(ආ) කල්බදු සමාගම් මගින් ව්‍යාපාරිකයින්ට අත් වන වාසි හතරක් සඳහන් කරන්න. (ල. 02)

iv. ව්‍යවසායකත්ව ප්‍රාග්ධන සමාගම් වල කාර්යභාරය පැහැදිලි කරන්න. (ල. 04)

v. (අ) කොටස් තැරැව්කාර සමාගම් වල කාර්යයන් 04 ක් සඳහන් කරන්න. (ල. 02)

(ආ) වාණිජ බැංකු විසින් ගිණුම් හිමියන්ට ලබා දෙන අයිරා පහසුකම යන්නෙහි අදහස පැහැදිලි කරන්න. (ල. 02)

(06) i. (අ) වාණිජ බැංකු විසින් සපයනු ලබන විද්‍යුත් බැංකු සේවාව යන්නෙන් අදහස නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ල. 02)

(ආ) ස්වයංක්‍රිය බැංකු සේවාව මගින් ගනුදෙනුකරුවන්ට අත්වන වාසි 04 ක් ලියන්න. (ල. 02)

ii. (අ) චෙක්පත් රේඛනය කිරීම යන්නෙහි අදහස පැහැදිලි කරන්න. (ල. 02)

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලයේ සංයුතිය සඳහන් කරන්න. (ල. 02)

iii. (අ) රක්ෂණයේ දී රක්ෂකයා හා රක්ෂිතයා අතර ඇති කර ගන්නා රක්ෂණ ගිවිසුමක් වලංගු වීම සඳහා පැවතිය යුතු මූලිකාංග 04 ක් සඳහන් කරන්න. (ල. 02)

(ආ) දේපල රක්ෂණයේ දී භාවිතා වන ප්‍රාරක්ෂණය යන්නෙහි අදහස පැහැදිලි කරන්න. (ල. 02)

iv. (අ) සමුද්‍රීය රක්ෂණයේ දී, නැව් කඳ රක්ෂණය යටතේ විවිධ රක්ෂණ ඔප්පු වර්ග ලබා ගත හැකිය. එසේ නැව් කඳ රක්ෂණය යටතේ ලබාගත හැකි රක්ෂණ ඔප්පු 04 ක් සඳහන් කරන්න. (ල. 02)

(ආ) පොදු (මහජන) වගකීම් රක්ෂණය යන්නෙහි අදහස පැහැදිලි කරන්න. (ල. 02)

v. (අ) සන්නිවේදනය යනු කුමක්දැයි නිර්වචනය කරන්න.

(ආ) ව්‍යාපාරයකට උපකාරක සේවාවක් ලෙස සන්නිවේදනය වැදගත් වන්නේ කෙසේ ද යන්න තහවුරු කිරීමට කරුණු 04 ක් දක්වන්න. (ල. 02)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

(07) i. ''ඔබ තොරතුරක් තවත් අයෙකුට ලබාදීමේ දී ප්‍රථමයෙන් ඒ සඳහා සුදුසු මාධ්‍යයක් තෝරා ගන්න. කිසිම විටක වැරදි තොරතුරු දෙන්න එපා. එවිට ඔබ පිළිබඳව ඇති විශ්වාසය බිඳ වැටේවි. එසේම සියළුම දෙනා ඉතාමත් කාර්යබහුල බැවින් කෙටියෙන් නමුත් සියළු විස්තර අන්තර්ගත වන පරිදි තොරතුරු ලබා දෙන්න.''

ඉහත දක්වා ඇත්තේ සන්නිවේදනය පිළිබඳ ව දේශනයකින් උපුටාගත් කොටසකි.

(අ) සඵලදායි සන්නිවේදනයක් යනු කුමක් ද? (ල. 02)

(ආ) ඉහත සිදුවීමේ සඵලදායි සන්නිවේදනයක පැවතිය යුතු ගුණාංග කිහිපයක් දැක්වේ. ඒ මොනවාදැයි සිදුවීමේ සඳහන් උදාහරණ ඇසුරින් දක්වන්න. (ල. 02)

ii. (අ) යම් තොරතුරක් සන්නිවේදනය කිරීමේ දී එය සාර්ථකව කර ගැනීමට එරෙහිව එල්ල විය හැකි බාධාවන් මොනවාද? (ල. 02)

(ආ) ලිඛිත සන්නිවේදනයේ වාසි දෙකක් ලියන්න. (ල. 02)

iii. කොළඹ මැනිං මාර්කට් හි එළවළු ගොවියෙකු වන සුරංග වැලිමඩ අල ගොවියකු වන බණ්ඩාරට වට්ස් ඇප් පණිවිඩයක් යැවූවේ අල 500kg ඇනවුම් කරමිනි. මෙම පණිවිඩය දුටු බණ්ඩාර වහාම තම ගොවියෙකුට පැවසුවේ අල 500 kg ක් සූදානම් කරනු ලෙසය. ඉන්පසු සුරංගට වට්ස්ඇප් පණිවුඩයක් යොමු කළ බණ්ඩාර පැවසුවේ, ඇනවුම ලබා දිය හැකි බවත් ඒ සඳහා ලොරි රථයක් සඳුදා දින එවන ලෙසත් ය. එම පණිවිඩය ලද සැනින් සුරංග ලොරි රථය හිමිකරු වූ නුවන්ට දුරකථනයෙන් පැවසුවේ පසුදින වැලිමඩට ගොස් අල තොගය රැගෙන එන ලෙසය.

සන්නිවේදන මූලිකාංග නම් කර මෙම සිදුවීම ඇසුරින් උදාහරණ දක්වන්න. (ල. 04)

iv. (අ) ගොඩබිම් ප්‍රවාහනය තුළ වැඩිම ධාරිතාවයකින් යුක්ත ප්‍රවාහන මාර්ගය කුමක් ද? එහි වාසි මොනවාද? (ල. 02)

(ආ) ප්‍රවාහනය රටේ පුරවැසියන් සහ ව්‍යාපාරවලට වැදගත් වන ආකාර දෙක බැගින් ලියන්න. (ල. 02)

v. (අ) ගබඩාකරණය යනු කුමක්ද? (ල. 02)

(ආ) ගබඩාවක ද්‍රව්‍ය එහා මෙහා කිරීමේ දී යොදාගන්නා උපකරණ 04 ක් ලියන්න. (ල. 02)

(08) තොග වෙළෙන්දාගෙන් නිෂ්පාදකයාට සිල්ලර වෙළෙන්දාට මෙන්ම පාරිභෝගිකයාට ද විවිධ ප්‍රතිලාභ හිමි වුවද තොග වෙළෙන්දාට එරෙහිව විවිධ චෝදනා ද පවතී.

i. (අ) එවැනි තොග වෙළෙන්දාට එරෙහිව පවතින චෝදනා මොනවාද? (ල. 02)

(ආ) ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික ආයතන අනුගමනය කරන විවිධ විකුණුම් ක්‍රම 04 ක් සඳහන් කරන්න. (ල. 02)

ii. රටවල් 02 ක් හෝ කිහිපයක් අතර යම් කාල සීමාවක් සඳහා වෙළඳ ද්‍රව්‍ය හුවමාරු කර ගැනීම සඳහා ඇතිකර ගන්නා එකඟතාවය, වෙළඳ ගිවිසුමක් ලෙස හැඳින්වේ.

(අ) වෙළඳ ගිවිසුම් දෙයාකාරයකින් ඇති කර ගනී. එම ආකාර දෙක නම් කරන්න. (ල. 01)

(ආ) 2024 වර්ෂය වන විටත් ක්‍රියාකාරී මට්ටමින් පවතින ශ්‍රී ලංකාව සම්බන්ධ වී සිටින වෙළඳ ගිවිසුම් 03 ක් සඳහන් කරන්න. (ල. 03)

iii. පහත සඳහන් සංකල්ප පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(A) අපනයන ණය සාධ්‍යකරණය (B) ප්‍රභවස්ථාන සහතිකය (ල. 04)

iv. කිසිදු බාධාවකින් තොරව වවිධ පාර්ශවයන්ට නිදහසේ භාණ්ඩ ආනයන හා අපනයනය කිරීමට අවකාශයක් පැවතිම නිදහස් වෙළඳාම ලෙස හැඳින් වේ. නමුත් ඇතැම් රටවල් නිදහස් වෙළඳාම කෙරෙහි විවිධ ආරක්ෂණවාදී ක්‍රියාමාර්ග අනුගමනය කරයි.

(අ) එවැනි නිදහස් වෙළඳාමට එරෙහිව පනවන තීරු බදු නොවන බාධා සඳහන් කරන්න. (ල. 02)

(ආ) ඇතැම් ප්‍රධාන පෙළේ රටවල් විසින් වෙනත් රටවලට එරෙහිව වෙළඳ සම්බාධක පැනවීම යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි කෙටියනේ පැහිදිලි කරන්න. (ල. 02)

v. වෙළඳ සංගම්, වෙළඳ ගිවිසුම් හා ජාත්‍යන්තර සංවිධාන විදේශ වෙළඳාමට ඇති කරන බලපෑම් මොනවාදැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 04)